**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව - 2022**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ ( "සංස්ථාව") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16හි 51 වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් භාවිතා කරනු ලබන ධාවන තත්ත්වයේ පවතින එකතු වටිනාකම රු 4,632,514 .ක් වූ වාහන 03ක් ඓතිහාසික පිරිවැයට ගිණුම්වල දක්වා තිබුණු අතර වත්කම්වල ජීව කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | වාහන තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන බව. | වත්කම්වල ජීව කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවලදී හඳුනා නොගත් රු.25,925,739 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂයේදී දිගුකාලීණ ණය ලෙස හඳුනාගෙන තිබුණද අවශ්‍ය අඩමාන ණය වෙන් කිරීම් කර නොතිබුණි. | ලැබිය යුතු ණයගැති ශේෂය යටතේ පැවති වෙන් වෙන්ව හඳුනාගත නොහැකි මෙම රු.මි.25.9 ක් වූ ශේෂය ලාභයෙන් අඩුකර දැක්වීමට එම ශේෂය කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී නැති අතර එම ශේෂය වෙන් වෙන්ව හඳුනාගත නොහැකි බැවින් ණයගැති ශේෂ | අයකර ගැනීම අවිනිශ්චිත ශේෂයන් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගිණුමෙන් අඩුකර දිගුකාලීන ලැබිය යුතු ගිණුමෙහි දක්වා ඇති බව. | |
| (ආ) | සංස්ථාව සතුව ඇති ඉඩම් 03 කට අදාළ වූ අක්කර 6340 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර ඇති නමුත් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. වර්ෂ කිහිපයක සිටම මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස හෙළිදරව් කිරීමක් පමණක් සිදුකර තිබූ නමුත් එම වත්කම් තක්සේරු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අරුවක්කාලු හුණුගල් නිධිය සහිත ඉඩම තක්සේරු කිරීමේ කටයුතු අඩපණ වී ඇති අතර ගාල්ලේ පිහිටි ඉඩම තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. එමෙන්ම ඉදිරියේදි ඉඩම් පන්තියම තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කරන බව. | වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ඇ) | ඝන මීටර් 25,750 ක් වූ හුණුගල් තොගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරවු කර තිබුණද වටිනාකම ගණනය කර දක්වා නොතිබුණි. | දැනට මෙම හුණුගල් තොගය භෞතිකව මැනීමක් සිදු කර නොමැති අතර ඉදිරියේදී තක්සේරු කර වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | හුණුගල් තොගයේ වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සංස්ථාව විසින් 1981 වර්ෂයේදි ලංකා සිමෙන්ති සමාගමේ රු.10 ක වටිනාකමින් යුතු කොටස් මිලදී ගැනීම සඳහා රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබුණි. එම ආයෝජනවල වෙළෙඳපොල වටිනාකම වාර්ෂිකව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම කල යුතු නමුත් සංස්ථාව විසින් එසේ සිදු නොකර 2016 වර්ෂයේදී වූ කොටසක වෙළෙඳපොල වටිනාකම රු.5.70 ක් වශයෙන් රු.617,662,779 ක් වූ ආයෝජන වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ලංකා සිමෙන්ති සමාගම ඈවර කිරීමට කටයුතු කරමින් පවතින අතර 2016 වර්ෂ යෙන් පසු ලංකා සිමෙන්ති සමාගම විසින් සංස්ථාවට ගිණුම් ලබා දී නොමැත. එම නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සිදු කිරීමට නොහැකි වී ඇත. | ආයෝජනවල වෙළෙඳපොල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඉ) | සංස්ථාවේ දේපල පිරියත හා උපකරණ තුළ ඇතුලත් වත්කම් වර්ග 3කට අදාළව ගිණුම්ගත කර ඇති එකතු වටිනාකම් රු.10,973,080 ක් වුවද, ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම වත්කම්වල එකතු වටිනාකම රු.6,719,780 වීමෙන් රු.4,253,300 ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතුව වනුයේ තොරතුරු සොයා ගත නොහැකි වත්කම්වල වටිනාකම බව. | වත්කම් ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම වගකීම් ලෙස දැක්විය යුතු වන්නේ වසරකට වඩා අඩු කාලයක් තුළ නිරවුල් කල යුතු වගකීම් වුවද, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ යටතේ රු.42,074,764 ක ශේෂයෙන් රු.25,250,966 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂයන් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. ඉන් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු මුදල රු.14,374,689 ක ශේෂය | අදහස් දක්වා නොමැත. | ණයහිමි ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

සම්බන්ධයෙන් ශේෂ සනාථන කිරීම් ලබාගෙන නොතිබුණි.

## 1.6 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු රු.181,876,862 ක් වූ ශේෂයෙන් රු.27,699,106 ක් වසර 3 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින ශේෂයන් විය. | මේ සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදි සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | ණයගැති ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 756 | වටිනාකම රු.238,255 ක් වූ අවසන් තොගය සහ රු. 808,769,061 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අවසන් තොගය සම්බන්ධව ඉදිරියේදි භෞතික තහවුරුවක් සිදු කිරීමට කටයුතු කරන බව සහ 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළියෙල කරමින් පවතින බවත් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 60,802,048 ක ලාභය වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 44,642,491ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 16,159,557 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මූල්‍ය වියදම් රු. 6,628,629 කින් වැඩිවුවද ලද කෙටිකාලීන තැන්පතු ආයෝජන මත ලද පොලී ආදායම රු. 19,608,587 කින් ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කන්කසන්තුරෙහි පිහිටි සංස්ථාවට අයත් තෙල් ටැංකි 2 ක් හා නළ පද්ධති ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම වෙත ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව ලබා දී තිබුණු අතර, තක්සේරු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 22 දිනැති තක්සේරු වාර්තාව මත පදනම්ව 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.201,360,000 ක මුදලක් සංස්ථාව වෙත අයවිය යුතු බවට තක්සේරු කර තිබුනද, එම මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි. | මෙම තෙල් ටැංකිවලට අදාළව ලැබිය යුතු බදු කුළිය, සංස්ථාවට ලැබිය යුතු වුවද ඉඩම් අයිතිය නිරාකරණය නොවීම හේතුවෙන් මුදල් ගෙවීම අතපසු කර ඇති බව. | මෙම හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු.1,200,000 ක් වූ ගාල්ල උණවටුන කැස්බෑපාන ඉඩම සුනාමියෙන් හානි වූ නිවාස 60 ක් ඉදිකිරීම සඳහා හබරාදූව ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කර ගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු මුදලක් ලබා ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි. | අදාළ වන්දි මුදල් ලබා ගැනීම සඳහා 2022 නොවැම්බර් මස පත්වූ නව සභාපතිතුමන් විසින් පෙරකලාසි අත්සන් කොට භාර දී ඇති අතර ඉඩමේ අයිතිය තහවුරු කර වන්දි ලබා ගැනීමට කටයුතු කළ යුතු බව සහ ඉඩම තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සංස්ථාවට ලැබිය යුතු වන්දි ලබා ගැනීමට අප්‍රමාදව ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සංස්ථාව හා පුත්තලම සිමෙන්ති කම්පැනි ලිමිටඩ් හෙවත් වර්තමාන සියැම් සිටි සිමෙන්ති ලංකා ලිමිටඩ් අතර 1996 අගෝස්තු 23 දින අත්සන් කරන ලද අංක 495 දරණ ගිවිසුම මඟින් අරුවක්කාලු හුණුගල් සහිත ඉඩම වාර්ෂික ස්ථාවර බදු කුලී පදනම මත වසර 50 කට බදු දීමට ගිවිසුම් ගතව තිබූ අතර 2019 නොවැම්බර් 07 දින අත්සන් කල අංක 268 දරන අතිරේක බදු ගිවිසුම මඟින් සෑම වර්ෂ 5 කට වතාවක් සියයට 12 ක බදු කුලිය වැඩි වීමේ ප්‍රතිශතය මත 2019 වර්ෂයේ සිට බදු කුලී ආදායම ඇ.ඩොලර් 319,118 ක් ලෙස වැඩි කර තිබුනි. නමුත් 1993 සිට 2018 දක්වා පළමු ගිවිසුමෙන් අහිමි වූ වාර්ෂික බදු කුලිය ලබා ගැනීම පිළිබඳව තීරණයකට එළඹීමට සංස්ථාවට නොහැකි වී තිබුණි. තවද, අතිරේක බදු ගිවිසුම සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මේ පිළිබඳ රේඛීය අමාත්‍යාංශය දැනුවත් කිරීමෙන් පසු සිදුව ඇති මුදල් අක්‍රමිකතාවය පිළිබඳව 2020.06.25 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කොට ඇති අතර ඒ සම්බන්ධ ඉදිරි කටයුතු පිළිබඳව සොයා බලන බව. | ගිවිසුම් අත්සන් කිරීමට පෙර නීතිපති සහ රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගත යුතු අතර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ගිවිසුම් අත්සන් කළ යුතුය. |
| (ඈ) | වටිනාකම රු. 750,000 ක් වූ දුම්රිය එන්ජිමක් වර්ෂ කිහිපයක සිටම විකිණීම සඳහා තබා ඇති වත්කම් ලෙස දක්වා තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිෂ්කාර්යව පවතින එම වත්කම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එම දුම්රිය එන්ජිම විකිණීමේ අරමුණ මේ වන තුරු ආයතනය විසින් වෙනස් කර නොමැති නිසා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 05 හි 09 වගන්තිය ප්‍රකාරව එම වත්කම විකිණීම සඳහා වූ වත්කම් යටතේ ගිණුම් තබා ඇති බව | නිෂ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1957 අංක 49 දරන කාර්මික සංස්ථා පනත මඟින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ දැක්ම ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ දියුණුව සඳහා මගපෙන්වීම සහ නායකත්වය ලබා දීම වන අතර මෙහෙවර වශයෙන් රටේ අවශ්‍යතා සපුරා ලීම සඳහා ගුණාත්මක සිමෙන්ති හා අනෙකුත් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණවත් ලෙස සැපයීම සහතික කිරීම වුවද | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව | සංස්ථාව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුවන ආකාරයට මෙන්ම සංස්ථාව සතු ස්වභාවික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | වර්තමානය වන විට සංස්ථාව විසින් සිමෙන්ති හෝ සිමෙන්ති ආශ්‍රිත කිසිදු නිෂ්පාදනයක් සිදු කරනු නොලබන අතර සංස්ථාව සතු අරුවක්කාලු හුණුගල් නිධිය බදු දීමෙන් ලැබුනු රු.64,062,938 ක් හා කොල්ලුපිටියේ පිහිටි ඉඩම රථගාලක් සඳහා බදු දීමෙන් ලැබුනු රු. 4,753,438 ක් වූ කුලී ආදායම පමණක් 2022 වර්ෂයේ සංස්ථාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වී තිබුණි. | | |
| (ආ) | ඉහල වටිනාකමකින් යුත් බර ඛණිජ ද්‍රව්‍ය සහිත අරුවක්කාලු හුණුගල් නිධිය සහිත ඉඩමේ ඉහළ පස් තට්ටුව හා කැණීම් කිරීම සඳහා ලංකා ඛනිජ වැලි සමාගම සමඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාල සීමාව තුළ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුනද, එම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සහ අදාළ පාර්ශව සමඟ ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | ලංකා ඛණිජ වැලි සමාගම මෙම ව්‍යාපෘතිය ඒකාබද්ධ ව කර ගෙන යාම ප්‍රතික්ෂේප කර ඇති බවත්, ඉලූකා ඉන්ටර්නැෂනල් ආයතනය මෙම ව්‍යාපෘතිය සඳහා අවසර ඉල්ලා සිටිය ද ඔවුන් සංස්ථාවට කිසිඳු මුදලක් ගෙවීම ප්‍රතික්ෂේප කර තිබෙන බැවින් ඔවුන් සමඟ මෙම ව්‍යාපෘතිය කර ගෙන යාම සංස්ථාව ප්‍රතික්ෂේප කර ඇති බවත්, රාජ්‍ය අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි 2023 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ආශා මිනරල් ආයතනයට ලබා දී ඇති අතර මෙම ඛනිජ වැලි නිස්සාරණය කරන භූමියේ අති නවීන පහසුකම් වලින් යුතු රසායනාගාරයක් හා පරීක්ෂණාගාරයක් පිහිටුවීමට කටයුතු කරන බව. | සංස්ථාව සතු ස්වභාවික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක අමප/21/0175/320/004 හා 2021 පෙබරවාරි 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව කන්කසන්තුරෙහි පිහිටි කර්මාන්ත ශාලාවේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ඉවත් කර කර්මාන්ත ශාලා පරිශ්‍රය පිරිසිදු කිරීමට කටයුතු කර තිබුණි. ඊට සමගාමීව 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ කර්මාන්තශාලා පරිශ්‍රයෙහි පිහිටි ගොඩනැඟිලි වල තත්ත්වය පිළිබඳව වාර්තාවක් සකස් කිරීම, පරිශ්‍රයෙහි ඇති යකඩවල ප්‍රමාණය ගණනය කර වාර්තාවක් සකස් කිරීම, පරිශ්‍රය තුළ වැවී ඇති පඳුරු ඉවත් කර විසිරී ඇති යකඩ ගොඩ ගැසීම, විශාල යන්ත්‍රෝපකරණ කර්මාන්තශාලා පරිශ්‍රයෙන් ගලවා ඉවත් කිරීම හා සුන්බුන් වූ ගොඩනැඟිලි ඉවත් කිරීම | 2022.02.14 දින අදාළ වාර්තා අමාත්‍යාංශය වෙත භාරදීමෙන් පසු 2022 අගෝස්තු මාසයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමට ටෙන්ඩර් මණ්ඩලයක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇති බවත් කර්මාන්තශාලා පරිශ්‍රය පිරිසිදු කිරීමේ කටයුතු සිදු කරනු ලබන්නේ කර්මාන්ත අමාත්‍යාංශය මඟින් බවත්. | සංස්ථාව සතු දේපළ ඵලදායි ආයෝජනයක් සඳහා යොදාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආදී කාර්යයන් ඇතුලත් කර තිබුණද, එම ක්‍රියාමාර්ග කිසිවක් සමාලෝචිත වර්ෂයේදී ඉටු කර නොතිබුණි. | | |
| (ඈ) | ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වූ පර්චස් 89.07 ක් වූ කොල්ලුපිටිය ඉඩම 2008 වර්ෂයේදි ලංකා බැංකුවට උකස් කර ලබා ගෙන තිබූ ණය මුදල 2017 වර්ෂයේදි 97,700,000 කට ප්‍රතිව්‍යුහගත කර තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ගෙවිය යුතු ණය ශේෂය රු.48,700,000 ක් විය. මෙම ණය මුදල වෙනුවෙන් 2022 වර්ෂයේ රු.12,140,403 ක පොලී මුදලක් ගෙවා ඇතත් , එකී ඉඩම බදු දීමෙන් වර්ෂයේ ලද කුලී ආදායම රු.4,753,438 ක් පමණි. ඒ අනුව රු.මිලියන 735 ක් පමණ වටිනා ඉතාමත් ඉහළ වාණිජමය වටිනාකමකින් යුතු මෙම ඉඩම ඵලදායි ආයෝජනයක් සඳහා යොදා ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. | මෙම ඉඩම ඉහල වාණිජ වටිනාකමකින් යුත් ඉඩමක් වන අතර මිශ්‍ර ආයෝජන ඵලදායි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම නාගරික සංවර්ධන අධිකාරී පනතේ අනුමැතිය සහිතව කළ යුතු අතර සුදුසු ආයෝජකයෙකු සොයා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව හා මේ වන විට ඒ සම්බන්ධව මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙල කර ඇති බවත් එම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන බව. | සංස්ථාව සතු දේපළ ඵලදායි ආයෝජනයක් සඳහා යොදාගත යුතුය. |